**මාතලේ මහා නගර සභාව -  2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාතලේ මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මාතලේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක ණය ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරියෙකුගේ හිඟ ණය ශේෂය රු.42,923 ක් වුවද, සේවක ණය ගිණුමේ එය රු.44,988 ක සෘණ ශේෂයක් ලෙස දැක්වීම හේතුවෙන් සේවක ණය ගිණුම රු.87,911 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 ගිණුම මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල 2023 වර්ෂයේ දී අවස්ථා 13 කදී ගෙවන ලද රු.340,068 ක් සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිශ්චිත බිල්පත් වටිනාකම හඳුනාගත නොහැකිවීම හා අතපසුවීම් හේතුවෙන් බැරකම් ලෙස අවසන් ගිණුමට සටහන්වී නොමැති බව. | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාල, සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 12 කදී ගෙවන ලද රු.1,318,130 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි . | නිශ්චිත බිල්පත් වටිනාකම හඳුනාගත නොහැකිවීම හා අතපසුවීම් හේතුවෙන් බැරකම් ලෙස අවසන් ගිණුමට සටහන්වී නොමැති බව. | නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොළිය රු.568,078 ක් අඩුවෙන් ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ස්ථාවර තැන්පත් පොළිය රු.23,072 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | 2023 ගිණුම මඟින් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2020 වර්ෂයේදී කඩා ඉවත් කරන ලද රු.1,000,000 ක පැරණි ප්‍රජා ශාලා ගොඩනැඟිල්ලක් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 05 කට අදාළ උප ලේඛනවල ශේෂයන් සමඟ සැසඳීමේදී රු 219,537 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී අදාල නොසැසඳීම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා ලෙජරය හා ගිණුම සමඟ ඉදිරිපත් කරන ලද උප ලේඛන අතර ගබඩා ඒකක 11 ක රු.266,057 ක වෙනසක් විය. | උපලේඛන පරීක්ෂා කර වටිනාකමට නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | -එම- |

### 1.6.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 266 (අ) ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2017 ජුලි මස මුද්දර ගාස්තු ලෙස බිල්කර තිබුණු එහෙත් අයකරගෙන නොතිබුණු රු.3,225,700 ක් කපා හැර තිබුණි. | කළමනාකරණ කමිටුව වෙත යොමු කර එම අනුමැතීන් මත ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට කටයුතු සිදු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.26,549 ක වත්කම් විෂයක් හා රු.545,237 ක බැරකම් විෂයක් ශේෂ සනාථන, උප ලේඛන හා විනය ක්‍රියාමාර්ග ලිපිගොණු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ශේෂය පිළිබඳව සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලේඛන/උප ලේඛන හා ලිපි ගොනු පිළියෙල කල යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

**නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත | | | |
| | 267 (1) වගන්තිය | ළමා උද්‍යානයේ සෙල්ලම් උපකරණ යොදා ගාස්තු අයකිරීමට භාහිර පාර්ශවයකට ලබාදීමේ කාර්ය සඳහා, පෞද්ගලික උපකාරක පන්ති නියාමනය කිරිම සඳහා හා ගිලන් රථ සේවා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සම්මත කරගෙන නොතිබුණි. | කොළඹ/ මහනුවර නගර සභාවල අතුරු ව්‍යවස්ථා සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ලිපි යොමු කර ඇත. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | (i) 2021 ජුලි 08 දිනැති අංක 2235/54 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත II වන කොටසේ 4 (1) නියෝගය | ගොඩනැඟිල්ලක් ඉදිකිරීමේ දි සංවර්ධන බලපත්‍රයක් ලබා ගත යුතු වුවත් නිරීක්ෂණයට භාජනය වූ ගොඩනැඟිලි 6 ක් එවැනි බලපත්‍රයක් ලබා නොගෙන පදිංචිය සඳහා යොදාගෙන තිබුණි. | සංවර්ධන බලපත්‍ර ලබා ගන්නා ලෙස ලිපි මගින් දන්වා ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| | (ii)VI වන කොටසේ 83(3) නියෝගය ප්‍රකාර 2 වන උපලේඛණය අනුව හා 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පලකරන ලද නාගරික සංවර්ධන අධිකාරි පනතේ V වන උපලේඛණය | 2014 වර්ෂය සිට 2022 වර්ෂයේ අගෝස්තු 31 දක්වා කාලපරිච්ඡේදය තුළ නිරීක්ෂණයට භාජනය වූ අනුකූලතා සහතික ලබා නොගත් පුද්ගලයන් 14 දෙනකුගෙන් දඩ මුදල් අය කරගෙන නොතිබුණි. | දඩ මුදල් ගෙවන ලෙස දන්වා ලිපි යොමු කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 1983 අංක 09 දරන ගෝසාතකාගාර ආඥා පනතේ 9 අ.(1) (අ) හා (ආ) | මහා නගර සභාවේ පරිපාලනය යටතේ ගෝසාතකාගාර ඉදි නොකර වසර 06 කට වැඩි කාලයක සිට අඛණ්ඩව පෞද්ගලික ගෝසාතකාගාර පවත්වාගෙන යාම | සුදුසු ඉඩමක් සපයාගත හැකි වූ වහාම අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කර තිබුණි. | අදාල ඉදි කිරීම් කටයුතු සිදුකරන බව. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 571(2) | 2018 සිට 2021 කාලයට අදාල, කාලය ඉකුත් වු රු.1,297,600 ක තැන්පත් ශේෂ 83 ක් නියාදනය කර නොබුණි. | පොදු තැන්පත් ශේෂ අදාල ගිණුමට හෝ රජයේ ආදායමට බැර කිරිමටත් කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| | 5.3.13 (ඇ) ඡේදය | ගොංහාවෙල බස් නැවතුම්පල කඩ කාමර බදුදීම සඳහා තෝරාගෙන තිබුණු ලංසුකරුවන් සිව්දෙනෙකු ටෙන්ඩරය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබියදී ඔවුන්ගේ ලංසු සුරක්ෂන ඇප මුදල් ලෙස රු.40,000 ක් නිදහස් කර තිබුණි. | මුදල් ගෙවන ලෙස ලංසුකරුවන්ට දන්වා ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කල යුතුය. |
| (ඊ) | මධ්‍යම පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ | | | |
| | (I) 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන චක්‍රලේඛය | අතුරු බදු හෝ අතුරු කුළියට දීම සම්පූර්ණයෙන් තහනම් වුවද මහා නගර සභාව සතු අඹගහමුල හා ගොංගාවෙළ පොදු වෙළඳපොළ කඩකාමර 20 ක බදු ලබා ගත් පාර්ශවයන් එම කඩකාමර රු.5,000 සිට රු. 22,000ක් දක්වා මුදලකට අතුරු බදු දී තිබුණි. | අතුරු බදු ලබා දී ඇති බව තහවුරු වී ඇති අතර ගිවිසුම් අනුව ඉදිරි කටයුතු සිදුකරන බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කල යුතුය. |
| | (II) 2017 අගෝස්තු 03 දිනැති අංක 2017/3 දරන චක්‍රලේඛයේ 5 ඡේදය | මහා නගර සභාවේ සියලු නඩු සම්බන්දයෙන් නඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | නීති විෂය භාර නිළධාරියෙකු පත් කර නඩු ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යැමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කල යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවාදායකයන්ගෙන් අයකර තිබූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු නොකරන්නේ නම් වර්ෂය අවසානයේ පවතින එම ශේෂය ණයහිමියන් යටතේ පෙන්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ජාතිය ගොඩනැගීමේ බදු ලෙස රු.71,436 ක් ණයහිමියන් යටතේ ඍණ ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. | සභාවට ලැබෙන අගය හා ගෙවිය යුතු අගය අඩුකර ශේෂය පමණක් ගෙවනු ලබයි. මෙම වටිනාකම් ණයගැති හා ණයහිමි යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 79,574,869 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 74,897,187 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (I) | වරිපනම් බදු | 38,200,000 | 43,631,653 | 46,554,974 | 44,128,415 | 37,340,000 | 40,100,988 | 36,550,564 | 47,051,737 |
| (II) | කුලී | 27,062,000 | 27,299,964 | 26,488,416 | 15,517,135 | 26,401,667 | 22,309,090 | 17,483,218 | 14,705,587 |
| (III) | බලපත්‍ර ගාස්තු | 15,401,000 | 12,573,547 | 11,793,096 | 980,641 | 22,239,000 | 14,327,107 | 15,022,596 | 201,000 |
| (IV) | වෙනත් ආදායම් | 95,030,000 | 100,412,155 | 111,314,931 | 41,740,752 | 105,957,949 | 89,777,804 | 90,180,147 | 52,643,527 |
| | එකතුව | 175,693,000 | 183,917,319 | 196,151,417 | 102,366,943 | 191,938,616 | 166,514,989 | 159,236,525 | 114,601,851 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| | එක් ඒකකයකින් රු.50,000 කට වඩා වැඩි හිඟ හිටි දේපල 30 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.12,097,338 ක් විය. | රතු නිවේදන මඟින් වරෙන්තු නිකුත් කර ඇති අතර දීර්ඝකාලීනව අයකර ගැනිමට නොහැකි දේපල තහනම් කර ඉදිරි නීතිමය කටයුතු සිදුකරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව හිඟ වරිපනම් බදු අයකළ යුතුය. |
| **(ආ)** | **වෙළඳ බලපත්‍ර** | | |
| | සමාලෝචිත වර්ෂයට අදාළ වෙළඳ බලපත්‍ර සමීක්ෂණයේදී ආයතන 698 ක් හඳුනා ගෙන තිබුණු අතර එයින් 82 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබීම හේතුවෙන් රු.431,641 ක ආදායමක් අහිමි වී තිබුණි. | වෙළඳ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ආයතන 82 ක් වූ අතර තවදුරටත් රු. 431,640.85 ක් අය විය යුතු බව. | වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතුය. |
| **(ඇ)** | **කර්මාන්ත බදු** | | |
| | සමාලෝචිත වර්ෂයට අදාළ කර්මාන්ත බදු සමීක්ෂණයේදී ව්‍යාපාර ආයතන 1464 ක් හඳුනා ගෙන තිබුණ ද එයින් ව්‍යාපාර 162 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබීම හේතුවෙන් රු. 562,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | අය කර ගත යුතු කර්මාන්ත බදු ගාස්තුව රු.562,000ක් බව. | කර්මාන්ත බලපත්‍ර නිකුත් කළ යුතුය. |
| **(ඈ)** | **ජල ගාස්තු** | | |
| | වසර 18 ක පමණ කාලයක සිට හිඟ හිටි රු.4,802,812 ක ජල ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ජල ව්‍යාපෘතිය ජල සම්පාදන මණ්ඩලය වෙත පැවරීමේදී හිඟ හිටි මුදල් පියවා ගැනීමට නොහැකි වූ බව හා එය අයකර ගැනීමට ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ජල ගාස්තු අයකර ගැනීම සිදුකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජකාරි නොවන කටයුත්තක් වෙනුවෙන් මහා නගර සභාවට අයත් වාහනයක් 2022 මාර්තු 12 හා 13 දෙදින රු. 10,736 ක් වැයකර ඉන්ධන ලීටර් 61 ක් යොදා කිලෝමීටර් 441 ක් ප්‍රදේශයෙන් පිටත ධාවනය කර තිබුණි. | මෙම ගමන සඳහා කැඳවීමේ ලිපියක් හෝ පැමිණීමේ සහතිකයක් ලැබී නොමැති බව. | නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතුව රු. 75,340,140 ක් විය. | ලැබියයුතු ගිණුම් ශේෂ අයකර ගැනීමටත් ගෙවීම් පැහැර හරින්නන් සම්බන්දව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරන බව. | ලැබියයුතු ගිණුම් ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතුව රු.107,254,465 ක් විය. | දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන ශේෂ ඉදිරියේදී නිරවුල් කරන බව. | ගෙවියයුතු ශේෂ නිරවුල් කල යුතුය. |
| (ඇ) | වසර 6 ත් වසර 28 ත් අතර කාල පරාසයක සිට අවස්ථා 35 කදී නිකුත් කරන ලද එකතුව රු.491,080 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිය වී ඇතත් ගිණුමෙන් ඉවත් කිරීමට අතපසු වී ඇති බව හා ඉවත් කිරීමට කටයුතු කරන බව. | අත්තිකාරම් ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඈ) | 2012 වර්ෂයට පෙර සිට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. 140,400 ක ඇප තැන්පතුවක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීමට ඇති ශේෂ සඳහා හිලව් කර ඇති බවට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගිණුම් වලින් ගැලපීමට කටයුතු සිදුකරන බව. | ශේෂ නිරවුල් කල යුතුය. |
| (ඉ) | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2020 වසරේදී මිළදීගෙන තිබුණු රු.514,080 ක කොන්ක්‍රීට් කසළ බඳුන් 136 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිෂ්කාර්යව ගොඩ ගසා තිබුණි. මෙම ගොඩ ගසා ඇති රු. 26,460 ක කසළ බඳුන් 07 ක් කැඩී විනාශ වී තිබුණු අතර රු.68,000 ක බඳුන් 18 ක ඌනතාවයක් පැවතුණි. | නැවත මිලදී ගැනීමේදී නිසි ශක්‍යතා අධ්‍යනයකින් යුක්තව මිලදී ගැනීමටත් බෙදා හැරීමේ ක්‍රම වේදය විධිමත් කිරීමටත් පියවර ගන්නා බව. | නිසි ශක්‍යතා අධ්‍යනයකින් යුක්තව මිලදීගැනීම් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ ඉහළ මහල ත්‍රිමාණ සිනමා ශාලාවක් සඳහා වර්ග අඩි 2000 ක් සඳහා ගිවිසුම්ගත වී බදු දී තිබුණද ගිවිසුම්ගතවී තිබුණ ප්‍රමාණය ඉක්මවා වර්ග අඩි 3972 ක් පරිහරණය කරන බව 2022 නොවැම්බර් 11 දින කරන ලද පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.ඒ අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු.3,719,191 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | පඩිපෙළෙහි සිට සිනමා ශාලාව වෙත වර්ග අඩි 191 ක ඉදිකිරීමක් සිදුකර ඇත්ද යන්න පිළිබඳව වාර්තා කරන ලෙස නාගරික ඉංජිනේරු වෙත දන්වා ඇති බව. | ගිවිසුම් විධිමත් කිරීමට හා කුලී අය කිරීමට කටයුතු කල යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාවට අයත් භූමියක් තුළ බාහිර පාර්ශවයන් විසින් තම වියදමින් ඉදිකර තිබුණු රු. 195,000,000 ක ගොඩනැගිලි 4 ක් විධිමත් ලෙස නගර සභාව වෙත පවරා ගැනීමකින් තොරව එම වටිනාකම නගර සභාව සතු වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ජනල් සටහන් මඟින් නිවැරදි කර ඇති බව. | පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවැති එකතුව රු.1,970,000 ක වාහන 05 ක් සහ යන්ත්‍රයක් වසර 1 ත් වසර 11 ත් අතර කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | අළුත්වැඩියා කල හැකි වාහන අළුත්වැඩියා කිරීමටත් නොහැකි ඒවා වෙන්දේසි කිරීමටත් කටයුතු කරමින් පවතින බව. | අළුත්වැඩියා කර උපයෝජන කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ශක්‍යතා අධ්‍යයනයක් සිදුනොකර කසළ බැහැර කිරීම සඳහා 2010 අගෝස්තු 18 දින රු.2,000,000 කට මිලදීගත් විහාරගමවත්ත ඉඩම නිෂ්කාර්යව පැවතුණි. | හුණුගල් කැණීම සඳහා බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කල යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා නගර සභාවේ අනුමත කාර්යමණ්ඩලයේ තනතුරු 31 ක පුරප්පාඩු 144 ක්ද තනතුරු 02 ක අතිරික්තතා 10 ක්ද පැවතුණි . | රජය මඟින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණයක් මත සියළු බඳවා ගැනීම් අත්හිටුවා ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිමට කටයුතු කල යුතුය. |
| (ආ) | වසර 1 සිට වසර 5 අතර කාල පරාසයක ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය හා වැඩ තහනම් කරන ලද නිලධාරීන් 34 කගේ ආපදා ණය, උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් එකතුව රු.2,638,155 ක් අයකර ගෙන නොතිබුණි. | සේවක ණය අයකිරීම් හා ගෙවීම් පරික්ෂා කර බලා ඉදිරියේ දි නිරවුල්ව පවත්වා ගෙන යන බව. | අයකර ගැනීමට කටයුතු කල යුතුය |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **එඬවඩ ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම - රු.1,935,633** | | |
| | එඬවඩ ක්‍රීඩාංගනයේ ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම වෙනුවෙන් සකස් කර තිබුණු ඇස්තමේන්තුව තුල අනුමත ඇස්තමේන්තුව සංශෝධනයකින් තොරව ඉටුකළ යුතු වැඩ කොටස් වලින් රු.1,132,237 ක වැඩ විෂයයන් 16 ක් ඉටු නොකර රු. 404,876 ක අමතර වැඩ විෂයයන් ඉටු කර තිබුණි. වැඩ විෂයය අංක 14 යටතේ බිත්ති මත පොටි යෙදීම සඳහා රු.32,623 ක් ගෙවා තිබුණ ද භෞතික පරීක්ෂාවට අනුව එසේ පොටි යෙදීම සිදු කර නොතිබුණි. | වහලය අළුත්වැඩියා කරන විටදී වහලයේ ඇස්බැස්ටස් ෂීට් බොහොමයකම පිපිරුම් ඇති බැවින් සම්පූර්ණ වහලයම අලුතින් ඇස්බැස්ටස් සීට් යොදා නැවත සෙවිලි කිරීමට සිදු වී ඇති බව. | ඇස්තමේන්තු සංශෝධනය කර අනුමත කරගත යුතුය. |
| (ආ) | රු.473,786 ක ඇස්තමේන්තුවක් මත ඉදිකර තිබුණු හුලංගමුව නිදහස් මාවතේ ඉදිකර තිබුණු කොන්ක්‍රීට් මාර්ගයේ මීටර් 31 න් මීටර් 27.3 ක් මහා නගර සභාවේ එවකට සිටි සභිකයෙකුගේ නිවස සඳහා ප්‍රවේශ විමට පමණක් භාවිතා කල හැකිව තිබුණි. | ප්‍රතිපාදන ඌණතාවය හේතුවෙන් ඉතිරි කොටස සංවර්ධනය නොකල බව. | වැඩි ප්‍රතිලාභීන් පිරිසකට භාවිතයට ගතහැකි ව්‍යාපෘති සඳහා අරමුදල් යෙදවිය යුතුය . |